## ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තා

## I - කොටස

## ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව

### 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශිර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව |

### 2. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

ක්‍රීඩා අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් පළයෙල කර නොතිබුණි. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගිණුම් වර්ෂය ආරම්භයේ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2010 ජනවාරි සිට අපෙල් දක්වාත් මැයි සිට ජුලි දක්වාත් පමණක් වෙන් වෙන් වශයෙන් සැලසුම් දෙකක් පිළියෙල කර තිබුණි.

### 3. ගිණුම්

#### 3.1 විසර්ජන ගිණුම

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල විසර්ජන ගිණුම් 02 ක් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,389,084,390 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,218,823,919 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු.71,796,517 ත් රු.98,463,954 ත් අතර පරාසයක ප්‍රමාණයන්ගෙන් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ත් සියයට 10.18 අතර පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **136** | ක්‍රීඩා අමාත්‍යාංශය | 197,441,390 | 224,815,000 | 191,700,779 | 158,759,094 | 5,740,611 | 66,055,906 |
| **219** | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව. | 299,603,000 | 667,225,000 | 291,648,985 | 576,715,061 | 7,954,015 | 90,509,939 |
| | එකතුව | 497,044,390 | 892,040,000 | 483,349,764 | 735,474,155 | 13,694,626 | 156,565,845 |

### 3.2 අත්තිකාරම් ගිණම්

#### 3.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 02 ක් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණ.

**(ආ) සීමා පිළපැදිම**

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළපැද තිබුණ.

### 3.3 පොදු තැන්පත් ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා දෙපාර්තමේනතුවේ පොදු තැන්පත් ගිණුම් ශේෂයන්හි එකතුව රු.55,131,137 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විසර්ජන ශීර්ෂය | කාල විශ්ලේෂණය | | | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 5 ට අඩු | |
| | | රු. | රු. | රු. | රු. |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 136 | 5,727 | 1,342,187 | - | 1,347,914 |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 219 | 34,661,916 | 16,299,452 | 2,821,855 | 53,783,223 |
| එකතුව | | 34,667,643 | 17,641,639 | 2,821,855 | 55,131,137 |

## II - කොටස

### එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.6 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 802 | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 18 දිනැති අංක අය.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |

### (ආ) අයවැය විචලනය

(i) ශිර්ෂ 136 යටතේ වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු. 695,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 99% ත් 26% ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) පුනරාවර්තන වැය විෂයයන් 03 කට වෙන්කළ රු.2,700,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

### (ඇ) පොදු තැන්පත් ගිණුම

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.1,347,914 ක් වූ අතර, 2009 මැයි 22 උන ක්‍රීඩා අරමුදලට පෞද්ගලික රූපවාහිනී ආයතනයකින් ලැබී තිබුණු රු.1,268,290 ක මුදලක් පොදු තැන්පත් ගිණමේ රඳවාගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 13601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.71,484 ක් වූ අතර මෙම ශේෂය 2008 ජනවාරි 18 දින සේවයෙන් පහ කරන ලද නිලධාරියෙකුට අදාල ශේෂයක් විය. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) ණය පාලන ගිණුම අනුව දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.14,869,937 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.15,045,435 ක් විය.මේ අනුව රු.175,498 ක වෙනසක් පවතින අතර මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) වෙනත් දෙපාර්තමේන්තුවල සිට අමාත්‍යාංශය වෙත ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් 05 දෙනෙකුගේ එකතුව රු.1,827,468 ක් වූ ආරම්භක ණය ශේෂ සාමාජික ණය ලේඛණයේ සටහන් කර නොතිබුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

**බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.2,274,232 ක් වූ අතර එම බැරකම් වර්ෂ 01 කට අඩු කාලපරිච්ජේදයකට අයත් විය.

## 1.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළ යුතු ශේෂ**

2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ වල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

**කාල විශ්ලේෂණය**

| ගැලපුම් පිළබඳ විස්තරය | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 වැඩි වර්ෂ 3 ට අඩු | එකතුව |
| --- | --- | --- | --- |
| | රු. | රු. | රු. |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 12,154 | 92,805 | 104,959 |

## 1.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 08 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 33 | 23 | 10 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 22 | 13 | 09 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික කොන්ත්‍රාත් පදනම) | - | 08 | - | 08 |
| | එකතුව | 66 | 53 | 21 | 08 |

## 2. විසර්ජන ශිර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා ව මුල්‍ය වාර්තා, සැසදුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සදහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011සැප්තැම්බර් 26 දින දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබද විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සදහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබද සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබද තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසදුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නලධාර්ගේ හා ගණන් දීමේ නිලධාර්ගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිලිබඳ විගණන නිරීක්ෂණ

2010 දෙසැම්බර් 31 දිනට මුලා වාර්තා හා පොත් අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.13 දක්වා වූ ජේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරිම

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලෙඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 802 | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.මෙය පසුගිය වර්ෂවල වාර්තාවලින් ද පෙන්වා දී තිබුණි. |
| පාඩු හා හානි ලේඛන | මුදල් රෙගුලාසි 110 | පිළියෙල කර නොතිබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවරවත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිළියෙල කර නොතිබුණි. |
| පාලන වාර්තාව | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පාලන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

(ii) ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම, වියදම් සඳහා අනුමැතිය නොවීම,කළ වැඩ වාර්තා නොවීම, අදාළ නාමලේඛනයන් නොවීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම නිසා එකතුව රු.5,290,724 ක මුදලකට අදාළ වූ ගනුදෙනු 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(iii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2011 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.396,135,969 ක් විය.

**(ආ) අයවැය විචලනය**

(i) ශීර්ෂ 219 යටතේ වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 6,850,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 80% ත් 30 % ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 66 පකාර පුනරාවර්තන වියදම් සඳහා අධිකාර පත්‍ර 5 ක් මගින් කරනු ලැබූ රු.3,700,000 ක මාරුකිරීම් විසර්ජන ගිණුම තුලින් හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.2,821,855 ක් වූ තැන්පත් ශේෂ 14 ක් සම්බනධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම් ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 565(4) ප්‍රකාරව එක් එක් වර්ෂය සඳහා අලුත් තැන්පත් ලෙජරයක් විවෘත කර එක් එක් විෂයයක් වශයෙන් පෙර වර්ෂ වල ශේෂයන් ඉදිරියට ගෙන ආ යුතු වුවත් තැන්පත් ලෙජරය 2009 සහ 2010 වර්ෂ වෙනුවෙන් එකම ලෙජරයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර එක් එක් විෂයයන්ට අදාළ ශේෂයන් ලෙජරයේ සටහන් කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව ලෙජරයේ අවසාන පිටු කිහිපය වෙන්කරවාගෙන තුලන ගිණුමක් පිළියෙල කළ යුතු වුවත් එම මාසික තුලන ගිණුම පිළියෙල කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ යුතු මාසික තැන්පතු සාරාංශය පිළියෙල කර නොතිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 21901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 169,625 ක්වූ අතර, එම හිඟ හිට ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) 1994 අගෝස්තු18 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.1 ඡේදය ප්‍රකාරව ණය අවකරණ සහ ඊට අදාල පොලී සටහන් කිරීම සඳහා මුද්‍රිත සී.සී 10 ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් ණය අවකරණ වෙනම ලේඛණයකත් ,පොලී අයකිරීම් වෙනම ලේඛණයකත් සටහන් කර තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව අනියම් සහ දෛනික වැටුප් ලබන සේවකයන් හැර අනෙකුත් සියළුම කාර්‍ය මණ්ඩලය සඳහා වැටුප් ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් එම ලේඛණය පවත්වාගෙන ගොස්

නොතිබුණි.පරිගණකය ආශ්‍රයෙන් ලබාගන්නා ලද මාසික දත්ත පමණක් ඇතුළත් වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756 හා 2008 නොවැම්බර්19 දිනැති අංක 436 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවද, 2010 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණු අතර අවසානවරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2009 වර්ෂය වෙනුවෙනි.

**(ආ) ගබඩා පවත්වාගෙන යාම**

ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සහ රිඩ් මාවත ක්‍රීඩා සංකීර්ණ ගොඩනැගිල්ලේ ස්ථාන කිහිපයක ගබඩා පවත්වාගෙන යන අතර රිඩ් මාවත ක්‍රීඩා සංකීර්ණයේ තිබූ ගබඩා කාමර විධිමත් ලෙස සකස් කර නොතිබීම හේතුවෙන් වර්ෂා ජලයට හසු වීමෙන් සමහරක් භාණ්ඩ හානියට පත්ව තිබුණි.

**(ඇ) අවසන් තොග ගණනය කිරීම**

වර්ෂ 20 කටත් වඩා පැරණ භාණ්ඩ ගබඩාවේ පැවති අතර ඒවායේ මිළ ගණන් සඳහන් නොවීම හේතුවෙන් වටිනාකම් ගණනය කළ නොහැකි විය. 2010 වර්ෂය තුළදී මිළ දී ගත් භාණ්ඩවලින් රු.3,455,625 ක් වටිනා භාණ්ඩ 2010 දෙසැම්බර් 31 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ පැවැතුණි.එය මුළු මිළදී ගැනීම්වලින් 54% ක පමණ අගයක් ගෙන තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.13,458,162 ක් වූ අතර එම බැරකම් වර්ෂයට අඩු කාලපරිච්ඡේදයකට අයත් විය.

**2.5 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ. 94 | 12,447,920 | වාර්ෂික ඇස්තමේන්තු වල මුදල් ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් පරිදි ඇත්නම් මිස කිසිදු වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය යුතු වුවත් වියදම් දැරීමෙන් පසුව ඉතිරිය ඉක්මවූ බැරකම් බැඳීම් අවස්ථා 06 ක දී ඇතිකරගෙන තිබුණි. |
| මු.රෙ. 395 (ඇ) | - | මුදල් නොකල චෙක්පත් සම්බන්ධයෙන් පිළියෙල කළ යුතු ලැයිස්තුව පිළියෙල කර නොතිබුණි. |
| මු.රෙ. 735(2) | - | 219 වැනි පොදු ආකෘතිය අනුව භාණ්ඩ ලැබීම් පත්‍ර පිළියෙල කර නොතිබුණි. |
| **(ii) චක්‍රලේඛ විධිවිධාන** | | |
| **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2010 අයවැය සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය (අයවැය චක්‍රලේඛ 143) | 1,064,626 | තත්‍ය සේවක අවශ්‍යතාව අනුව පුද්ගල පඩිනඩි ගණනය කළයුතු වුවත් පුද්ගල පඩිනඩි පුරප්පාඩු සංඛ්‍යාවද පදනම් කරගෙන ගණනය කිරීම නිසා වැය විෂය 219-01-01-1001 හි මුදල ඉතිරි වී තිබුණි. |
| 2010 නොවැම්බර් 04 දිනැති අංක 06/2010 දරන චක්‍රලේඛයේ 2.1 ජේදය | - | මුදල් පොත පියවීමට අදාළ වගකිව යුතු නිලධාරියෙකු පත්කර නොතිබුණු අතර 2010 දෙසැම්බර් 31 දිනට කිසිදු පුද්ගලයෙකු විසින් මුදල් පොත පියවා නම තනතුර යොදා අත්සන් කර නොතිබුණි. |

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති අතරමග නැවතීම සහ මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපාති පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

ටොරන්ටන් ක්‍රීඩා පිටියේ කෘතිම ධාවන පථය ඉදිකිරීම සඳහා රු.100,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු.93,200,000 ක් වෙනත් වැය විෂයයන් 04 කට මාරු කර තිබුණු අතර රු.6,800,000 ක් වූ ඉතිරි

ප්‍රතිපාදනය කිසිදු ව්‍යාපෘතියක් සඳහා භාවිතයට ගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු පැහැදිළි කර නොතිබුණි. 2010 ජනවාරි මාසයේදී මෙම ව්‍යාපෘතිය සඳහා මුල්ගල තැබීමේ උත්සවය වෙනුවෙන් රු.4,166,810 ක් වැය කර තිබුණි.

**(ආ) ව්‍යාපෘති අතරමග නැවතීම**

නුවරඑළිය තුරග තරඟ පිටිය සංවර්ධනය සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.227,670,000 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට රු.190,307,274 ක වියදමක් දරා තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2010 අගොස්තු සිට අතරමග නවතා දමා තිබුණි.

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කැබිනට් අනුමැතියකින් 2008 සැප්තැම්බර් 15 දින ඉදි කිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරන ලද 2009 ජූනි 30 දින වන විට වැඩ නිම කිරීමට එකඟ වී තිබුණු රිඩ් මාවත කෘත්‍රිම හොකී ක්‍රීඩාපිටිය 2011 අප්‍රේල් වන විටත් නිම කර නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව උපදේශන සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත කොන්ත්‍රාත් මුදලින් 3% - 6% දක්වා එකඟ වූ අගයකට ගෙවිය යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව 10% ක උපදේශන සේවා ගාස්තුවක් ගෙවා තිබුණි.

**2.7 කාර්යසාධනය**

2010 වාර්ෂික ඇස්තමේන්තු / ක්‍රියාකාර සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

සමහරක් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

ක්‍රීඩා ශක්ති වැඩසටහන

පහත කරුණ නිරීක්ෂණය කෙරේ

(i) "අන්තර් ජාතික තලයේ ජයග්‍රහන ලබා ගත හැකි කුසලතාවයන්ගෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරීම" ක්‍රීඩා ශක්ති වැඩ සටහනේ දර්ශනය වුව ද මළල ක්‍රීඩා, වොලිබෝල්, නෙට්බෝල්, කබඩි හා පාපන්දු හැරුණු විට අනෙකුත් ක්‍රීඩාවන් දිස්ත්‍රික්ක (3-4 ක් වැනි) කිහිපයක පමණක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණ කරා ළඟා වීමට හැකි වී නොතිබුණි.

(ii) ඉහත විස්තර අනුව බොහෝ ක්‍රීඩා, දිස්ත්‍රික්ක කිහිපයකට පමණක් සීමා වී තිබූ අතර ඒවා සෑම දිස්ත්‍රික්කයකම ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) ඉහත එක් එක් ක්‍රීඩාව සඳහා අනුමත විෂය නිර්දේශයක් සහ ඒ තුල ළ ලඟා කර ගත යුතු ඉලක්කයක් නිර්දේශ කර නොතිබුණි.බොහෝ විට එය පුහුණුකරුවන්ගේ හැකියාව මත තීරණය වී තිබුණි. පුහුණුවීම් ප්‍රගතිය පරීක්ෂා කිරීමට මාසික, ත්‍රෛමාසික හෝ වාර්ෂික පරීක්ෂණ පවත්වා නොතිබුණි.

(iv) ක්‍රීඩා ශක්ති ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කර තිබූ පොදු ව්‍යවස්ථා මාලාව අනුව එම ව්‍යාපෘතිය ඉහළ තලයකට ගෙන ඒම සඳහා විවිධ උපාය මාර්ගයන් හඳුන්වා දී තිබූ නමුත් ඒවා ක්‍රියාවට නංවා නොතිබුණි.

(v) ක්‍රීඩා ශක්ති පුහුණු වැඩසටහන් යටතේ අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණුකරුවන් සිටින අතර සෑම ක්‍රීඩාවක් සඳහාම බාහිර පුහුණුකරුවන්ගේ ප්‍රතිශතය ඉතා ඉහළ මට්ටමක පැවතුණි. බාහිර පුහුණුකරුවන් පිළිබඳ මනා ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බවත් ඔවුන් පූර්ණකාලීනව පුහුණු වැඩ සටහන් වල නොයෙදෙන බවත් නිරීක්ෂණය විය.

(vi) රඹ් මාවත ක්‍රීඩා සංකීර්ණයේ වැඩි දියුණු කිරීම් විධිමත් පරිදි කළමණාකරණය කර අපේක්ෂිත පරිදි කටයුතු ඉටු නොකිරීම මත වැය විෂය 219-2-2-3-2104 හි රු.64,003,323 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මුදල් රෙගුලාසි 66 යටතේ රු.10,000,000 ක මුදලක් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණු අතර එසේ නොකළේනම් ඉතිරිය 42.28% විය යුතුව තිබුණි.

**(ආ) ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම හා බෙදා හැරීම**

වැය විෂයය 219-2-2-2103 යටතේ ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කර දී තිබුණු අතර ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයතුලදී රු.6,410,590 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුනු නිරීක්ෂණය විය.

(i) ඇස්තමේන්තු පිළියෙල කිරීම හා මිළදී ගැනීම

* ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීමට අදාලව වාර්ෂික අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණු අතර අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි.

* ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පසුගිය වර්ෂයේ වියදමට සාපේක්ෂව ඉල්ලීම් කර තිබුණි.

* මෙම ප්‍රතිපාදන වැය කිරීම සඳහා සැලැස්මක් නොතිබුණු අතර අවස්ථානුකූලව ඇතිවන ඉල්ලීම් සඳහා මිළදී ගැනීම් සිදුකර තිබුණි.

(ii) භාණ්ඩ නිකුත් කිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

* සෑම වර්ෂයක් පාසාම ඉතා ඉහළ වටිනාකමක් ඇති ක්‍රීඩා භාණ්ඩ ප්‍රමාණයක් ක්‍රීඩා සංගම්, පාසැල් සහ වෙනත් පාර්ශවයන් වෙත ලබා දී තිබුණ ද, ක්‍රීඩා භාණ්ඩ බෙදාහැරීම සඳහා විනිවිධභාවයකින් යුතු වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

* විවිධ බාහිර පාර්ශවයන්ගේ මැදිහත් වීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා මත ක්‍රීඩා සංගම් සහ වෙනත් පාර්ශවයන් වෙත ක්‍රීඩා භාණ්ඩ බෙදාහැරීම සිදුකරන බව නිරීක්ෂණය වූ අතර දෙපාර්තමේන්තුවේ සෘජු මැදිහත් වීමෙන් භාණ්ඩ බෙදා දීම ඉතා අල්ප මට්ටමක පැවැතුණි. ඒ අනුව ක්‍රීඩා භාණ්ඩ බෙදා හැරීමේ දී විනිවිදභාවයක් දැකිය නොහැකි විය.

* අවශ්‍යතාවය පිළිබඳ කරන ලද ලිඛිත ඉල්ලීමක් , භාණ්ඩ නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් නොකරන අවස්ථා පැවැතුණි.

* ක්‍රීඩාභාණ්ඩ නිකුත් කිරීමේදී, භාණ්ඩ තොග ලේඛනයට ඇතුළත් නොකිරීම, නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා නොගැනීම, භාණ්ඩ භාරගත් බවට අදාළ පාර්ශවය විසින් අත්සන් නොයෙදීම සහ නිකුත් කිරීම් අදාළ භාණ්ඩය යටතේ සටහන් නොකර වෙනත් භාණ්ඩයක් යටතේ සටහන් කර තිබීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

* එක් එක් පාර්ශවයන් වෙත හෝ ක්‍රීඩා සංගමයන් වෙත එක් වරකට නිකුත් කළයුතු හා නිකුත් කළ හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණය පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණු අතර විවිධ පාර්ශවයන් වෙත විවිධ ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ නිකුත් කර තිබුණි.

**(ඇ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවීම**

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර නොතිබුණි. 2010 ජනවාරි සිට අප්‍රේල් දක්වාත් , මැයි සිට ජූලි දක්වාත් වෙන් වෙන් වශයෙන් සැලැසුම් දෙකක් පිළියෙල කර තිබුණු අතර අගෝස්තු සිට දෙසැම්බර් දක්වා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි

**2.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලැපුම් කළ යුතු ශේෂ**

2010 දෙසැම්බර් මාසය සඳහා පිළයෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලැපුම් පිළිබඳ විස්තරය | මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු |
|---|---|
| | රු. |
| (i) උපලබ්ධි නොවූ තැන්පත් | 8,483 |
| (ii) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් | 873,323 |
| (iii) හඳුනා නොගත බැර | 47,000 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* මදල් රෙගුලාසි 396 ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දින වනවිට කටයුතු නොකළ මාස 06 ඉක්මවූ චෙක්පත් වල වටිනාකම රු.873,323 ක් විය.

* මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව මුදල් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් පිළියෙල කළයුතු ලැයිස්තුව පිළියෙල කර නොතිබුණි.

## 2.9 අවිධිමත් ගනුදෙන

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගණදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

(i) 36 වන ජාතික මහා කීඩා උළෙලේ මැරතන් සහ ඇවිදීමේ තරග සඳහා නවාතැන් පහසුකම් සැපයූ පාසැලේ වැඩිදියුණු කිරීම් කටයුතු වෙනුවෙන් රු.600,000 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මෙම ආයතනය තෝරා ගෙන තිබුණු අතර මෙම කාර්ය සඳහා ඇස්තමේන්තුවක් හො කළ වැඩ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබණි.

(ii) රු.5,938,652 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝප දේශ සංග්‍රහයේ 12.14.1 ඡේදය ප්‍රකාර ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එයින් රු.3,630,500 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ තොගයක් අවශ්‍යතාවය හදුනා ගැනීමකින් තොරව මිළදීගෙන තිබුණි

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 ප්‍රකාරව භාණ්ඩ සඳහා පිරිවිතර සකස් කළ යුතු වුවත් ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රමාණයෙන් හා වර්ගයෙන් එක සමාන වූ එකතුව රු.395,885 ක් වූ උපකරණ එකම දිනයෙ දී එකම ආයතනයකින් සමාන කොටස් දෙකකින් මිළදී ගෙන තිබුණි.මෙය ටෙන්ඩර පටිපාටිය මගහැරීම සඳහා කළ ක්‍රියාවක් බව නිරීක්ෂණය විය.

### (ආ) වෙනත්

පහත කරුණු නිරීක්ෂණය විය

(i) ශක්තිවර්ධන ශාලාව සඳහා රු. 39,940,506 ක් වටිනා කාය වර්ධන උපකරණ මිළදී ගැනීම.

* උපකරණ මිළද ගැනීම සඳහා පූර්ව පුරෝකථනයක් සිදු කර ඊට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ඉල්ලා නොතිබුණු අතර පසුව මිළදී ගැනීම සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තුව රු.24,461,200 ක් විය. ගණිතමය වැරදි හේතුවෙන් එය රු.24,761,500 ක් ලෙස නිවැරදි විය යුතු වූ අතර මිළදී ගත් භාණ්ඩ වල සත්‍ය වටිනකම රු.39,940,506 ක් වීම හේතුවෙන් එම ඇස්තමේන්තුව ව්‍යාජ ඇස්තමේන්තුවක් බව නිරීක්ෂණය විය. සත්‍ය වියදම අනුව මෙය

අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කළ යුතු මිලදී ගැනීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

* අවශ්‍යතාවයන් අනුව භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නොඉල්ලීම නිසා 2010 වර්ෂයේ ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා වූ වැය විෂය 219-02-2103 සඳහා අයවැය ඇස්තමේන්තමගින් ප්‍රතිපාදන සලසා දී තිබුණේ රු.15,000,000 ක් පමණි. ප්‍රතිපාදනය ගැන සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් කාය වර්ධන උපකරණ මිලදී ගැනීම සඳහා පමණක් රු.24,940,506 ක් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

* මෙම උපකරණ 2010 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවල දී පැවැත්වීමට නියමිතව තිබූ පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා තරඟය හා ආසියානු ක්‍රීඩා උළෙලට සහභාගී වීමට නියමිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණු වීම් කටයුතු සඳහා ඉතා හදිසි මිලදී ගැනීමක් වශයෙන් අර්ථකථනය කර මිලදී ගැනීමට කටයුතු කර තිබුණ ද ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.8 වගන්තිය ප්‍රකාරව ඉහත තත්ත්වය හදිසි ප්‍රසම්පාදන යටතට නොගැනෙන අතර අදාළ භාණ්ඩ මෙම තරඟාවලය අවසන්වී මාස කිහිපයකට පසු මිලදී ගෙන තිබුණි.

* භාණ්ඩ ලැබීම් නියමිත පරිදි තොග පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

* වටිනාකම රු. 10,130,533 ක් වූ ක්‍රීඩා භාණ්ඩ ලැබීමට පෙර එනම් 2010 දෙසැම්බර් 31 දින අදාළ ආයතනය නමින් චෙක්පතක් ලියා ගෙවීම් නොකර අතරදවා ගෙන තිබුණි. මෙම චෙක්පත අවලංගු කර 2011 ජනවාරි 15 දින නැවත චෙක්පත් 03 ක් මගින් මෙම ගෙවීම නිරවුල් කර තිබුණ අතර රු.533,300 ක් වටිනා භාණ්ඩ ඇණවුම ප්‍රකාර නොවූ බැවින් එම මුදල අඩු කොට ගෙවීම් කර තිබුණි.ඒ අනුව ශුද්ධ ගෙවීම රු.9,098,371 ක් විය. කෙසේ වුවද මෙම භාණ්ඩ ලැබී තිබුණේ 2011 ජනවාරි 18 දින වන බැවින් භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් සිදුකර ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද මෙම භාණ්ඩ 2011 අප්‍රේල් දක්වා තොග පොතට ගෙන නොතිබුණි.

(ii) ග්‍රාමීය ක්‍රීඩා පිටි වැඩිදියුණු කිරීම

* ග්‍රාමීය ක්‍රීඩා පිටි වලට විදුලි ආලෝකය සැපයීම සඳහා රු.168,575 කට මිලදී ගෙන තිබුණු උපකරණ 219-2-2-2001-1 වැය විෂයය වෙනුවට 1405-2-2-2 වැය විෂයය යටතේ දක්වා තිබුණි.

* රු.33,750 ක් ගෙවා අවශ්‍යතාවනට නොගැලපෙන භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

## 2.10 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී පහත දක්වා ඇති පාඩු හා හානි සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

(i) මිළ අඩු ක්‍රීඩා භාණ්ඩ වෙණුවට වැඩි මිළ භාණ්ඩ මිලදී ගැනීම නිසා රු.1,727,676 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ii) දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් හා දෙපාර්තමේන්තු ගොඩනැගිලි විදුලි ආලෝක කිරීම වෙනුවෙන් නිකුත් කරතිබුණු රු.395,885 ක් වටිනා නැවත භාවිතා කළ හැකි විදලි උපකරණ එම කාර්යය නිමවීමෙන් පසු නැවත ගබඩාවට භාරදී නොතිබුණි.

## 2.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ක්‍රීඩා පාසැල් ව්‍යාපෘතිය

ක්‍රීඩා පාසල් ව්‍යාපෘතිය වෙනුවෙන් 2010 ජනවාරි සිට අගොස්තු දක්වා ගෙවා තිබුණු රු.5,284,000 ක් සම්බනධයෙන් පරීක්ෂා කිරීමේ ද එම ගෙවීම් අවිධිමත් හා අකාර්‍යක්ෂම ලෙස සිදු කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 15 | 11 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 170 | 123 | 47 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 51 | 41 | 10 |
| | එකතුව | 245 | 179 | 66 |

## 2.13 අභ්‍යන්තර පාලනය

**(අ) අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් නොවු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් ද විගණනයක් සිදු කර නොතිබුණි.